# බුද්ධ ධර්මය

## $10^4$ ශ්‍රේණිය

**5 වැනි පාඩම- සටහන**

**විදර්ශනා භාවනාව.**

සත්ත්වයා යනු ස්කන්ධ පහක එකතුවකි.එම ස්කන්ධයන් අනිත්‍ය වන නමුත් ලෝකය නිත්‍ය ලෙස දකී ;සැප ලෙස දකී .මෙම තත්ත්වය ලෝක සත්වයාගේ විපරීත වූ දැක්මකි. එම දැක්මෙන් මිදීමට සත්‍ය- සත්‍ය ලෙස ලෙසම අවබෝධ කරගැනීම ඇති කරගත හැක්කේ විදර්ශනා හෙවත් විපස්සනා වැඩීමෙනි. එනම් ලෝකයා සත්වයා යැයි කියනු ලබන ස්කන්ධ ධර්මයන්ගේ යථාර්ථය දැකීමයි.

කිසියම් අවස්ථාවක දී ආර්ය ශ්‍රාවකයා විසින් ස්කන්ධ ධර්මයන් අනිත්‍ය බැවින් දුක් සහිත ලෙස ද එම නිසා මා නොවන බව මනා නුවණින් අවබෝධ කර ගනී නම් එය ම නිවනට හේතු වේ මෙලෙස ත්‍රිලක්ෂණය අවබෝධ කරගත් තැනැත්තා ස්කන්ධයන්ගේ පවතින ගේ පවතින සැබෑ ස්වරූපය අවබෝධ කරගත් බැවින් එම ස්කන්ධයන් කෙරෙහි නොඇලෙයි. ස්කන්ධයන් කෙරෙහි ඇල්ම නොමැති බැවින් රාග ද්වේශ මෝහ ද්වේශ මෝහ ආදී කෙලෙසුන්ගෙන් අවබෝධයෙන් යුතුව මිදෙයි. එසේ මිදුණු බවට නුවණ පහළ වී වී එයින් ම නිවන් අවබෝධ කරගනී.

ප්‍රශ්න

1. විදර්ශනා භාවනාව ත්‍රිලක්ෂණ භාවනාව ලෙස ද ලෙසද හඳුන්වන්නේ ඇයි?
2. ස්කන්ධ ධර්මයන් අනුව අනුව ත්‍රිලක්ෂණය මෙනෙහි කරන ආකාරය (ස්කන්ධ පහටම පහටම) ලියා දක්වන්න.
3. යථාභූත ඤාණ දස්සනය යනු කුමක්ද?
4. එය නිවන් අවබෝධයට හේතු වන්නේ කෙසේ ද ?
5. පුද්ගලයාගේ මෙලොව දියුනුවට ත්‍රිලක්ෂණය දැකීම ප්‍රයෝජනවත් වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
   (ශිෂ්‍ය ජීවිතය, ගිහි ජීවිතය, වෘත්තිය ජීවිතය ඇසුරින්)